# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2463/08 - 2025 නොවැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2025.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/5/2017/HA/537.
*ප්‍රාදේශීය ලේකම් ගොනු අංකය*: බෙන්/2/7/3/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 10ඒ - වරකමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, "ගල්ගොඩ ගම්මැද්ද" ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ක.සි. 810912 හා 2025.08.25 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0547ක් (අක්. 0 රූඩ් 0 පර්චස් 21.6) වූ පහත විස්තර කෙරෙන "ආඩියාවත්ත" නැමති ඉඩම් කොටස.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: "ආඩියාවත්ත"; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක්, ස්ථිර ගොඩනැගිල්ලක් සහ ළිඳක් ඇත; හිමිකම් කියන අය: දායක සභාව, ශ්‍රී විජය ධර්ම පිරිවෙණ, ගල්ගොඩ ගම්මැද්ද, මහ ඉඳුරුව; ප්‍රමාණය: හෙක්. 0.0547.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.12.17 වැනි දින පෙ.ව. 10.00 ට බෙන්තොට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025.12.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**ඩබ්ලිව්. ඒ. ජනහිත,**
ප්‍රාදේශීය ලේකම් (රා.ආ.),
බෙන්තොට.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0127


1A - G 45766 - 23 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: BDD/LND/02/104-2018.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/2016/D/91.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 184A නයාපාමුල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නයාපාමුල ගමේ පිහිටි, ගාල්ල ජ්‍යොෂ්ඨ මැනුම් අධිකාරිගේ කැ.සි. 810417 හා 2025.07.25 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දක්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැලි වේ.

**කැබලි අංකය 01**
ඉඩමේ නම: කන්ද අද්දර වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. ජී. වයි. අයි. අබේරත්න; ප්‍රමාණය: හෙක්. 0.0013.

**කැබලි අංකය 02**
ඉඩමේ නම: කන්ද අද්දර වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. ජී. වයි. අයි. අබේරත්න; ප්‍රමාණය: හෙක්. 0.0012.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.01.23 වැනි දින පෙ.ව. 10.00 ට බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.01.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**නිලූකා. එල්. සූරියආරච්චි,**
ප්‍රාදේශීය ලේකම්,
බද්දේගම.

2025 නොවැම්බර් මස 11 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0128